**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

*මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.*

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයේ පරිශිෂ්ඨය 02 ඊ.ජී.3.8 හෙළිදරව් කිරීම් අනුව දේපළ පිරියත හා උපකරණ ක්ෂය සම්බන්ධයෙන් ක්ෂය කිරීමේ ක්‍රමය සහ වත්කම්වල ප්‍රයෝජ්‍ය ජීව කාලය හෝ ක්ෂය කිරීම් අනුපාතිකයන් සටහනක් මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, රු.47,418,952 ක් වූ සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙනුවෙන් එලෙස හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | කටයුතු කරන බව | අදාළ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සමඟ ඉදිරිපත් කර ඇති පරිශිෂ්ඨය 2 හි 1 ඇමුණුමෙහි සඳහන් ගිණුම් කේත අනුව පුස්තකාල පොත් ශේෂය තොග යටතේ වත්කමක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාවේ රු.4,131,350 ක් වූ පුස්තකාල පොත් වටිනාකම සටහන් අංක 16 යටතේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම ලෙස ගිණුම්ගත කර තිබුණි. | සටහන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අදාළ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයේ පරිශිෂ්ඨය 02 හි E.G.4.22 දිගුකාලීන ණයගැනීම් යටතේ දේශීය ණය සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.45,856,189 කට අදාළව පොලී අනුපාතිකය, ණය මුදලේ කාල සීමාව, ණය මුදල ලබාගත් දිනය, ණය මුදල ගෙවිය යුතු දිනය, ණය මුදලේ කොන්දේසි, අරමුණු, ඇප හා විශේෂ කරුණු ඇත්නම් ඒවා මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා ඇත. | අදාළ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා යොදන ලද ජ'නල් අංක 102 හේතුවෙන් රු.1,650,098 ක වටිනාකමකින් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ණයගැති ශේෂය අඩු වී තිබුණි. | පිළිතුරු දක්වා නැත. | වර්ෂයට අදාළ ආදායම් වියදම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ පහත සඳහන් ආදායම් විෂයයන් ගිණුම්ගත කිරීමේදී සත්‍ය වටිනාකමට වඩා අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.267,783 කින් අඩුවෙන් දක්වා තිබුණි. | එකග වන බව දන්වා ඇත. | නිවැරදි ආදායම් ශීර්ෂ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| ආදායම් විෂයය | ගිණුම්ගත කළ යුතු වටිනාකම | ගිණුම්ගත කළ වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මළඅපවහන ගාස්තු | 271,200 | 315,873 | 179,783 |
| විනෝද බදු | 850,956 | 762,956 | 88,000 |
| | | | ---------- |
| | | | 267,783 |
| | | | ====== |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පහත සඳහන් ආදායම් විෂයයන් 02 ක් ගිණුම්ගත කිරීමේදී සත්‍ය වටිනාකමට වඩා වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.237,618 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එකග වන බව දන්වා ඇත. | නිවැරදිව ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| ආදායම් විෂයය | ගිණුම්ගත කළ යුතු වටිනාකම | ගිණුම්ගත කළ වටිනාකම | වෙනස |
|---|---|---|---|
| --------------- | ---------- | ----------- | -------- |
| | රු. | රු. | රු. |
| ගලි රථ කුලී ආදායම් | 3,288,600 | 3,483,313 | 194,713 |
| වරිපනම් හා බදු | 10,376,272 | 10,419,177 | 42,905 |
| | | | ---------- |
| | | | 237,618 |
| | | | ====== |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඈ) | 2022 වර්ෂයේ දී ගිණුම්ගත නොවූ නිල නිවාස කුලී ආදායම රු.240,900 ක් හා හිඟ ආදායම රු.34,600 ක් සඳහා ගැලපීම් කිරීමේ දී රු.206,300 | එකග වන බව දන්වා ඇත. | හිඟ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් සමුච්චිත අරමුදලට හර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු.447,200 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී වරිපනම් සඳහා ලබාදී ඇති වට්ටම් රු.358,609 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.6,488,287 ක් ලෙස දැක්වීම හේතුවෙන් එම වියදම රු.6,129,678 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන අවස්ථාවේ ජ'නල් සටහන් හරහා නිවැරදිව ගැලපීම් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා ඇත. | වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර තිබුණු ගිණුම් විෂයයන් 16 ක ශේෂ හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන අනුව ශේෂ අතර රු.19,252,289 ක නොසැසඳීමක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන අවස්ථාවේ ජ'නල් සටහන් හරහා නිවැරදිව ගැලපීම් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා ඇත. | ආයතනයේ ගිණුම් පොත්පත් හා ලේඛන සමඟ තුලනය විය යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| කර්මාන්ත ණයගැතියෝ | 26,204,118 | ශේෂ සනාථ කිරීම | | |
| කර්මාන්ත ණයහිමියෝ | 32,021,890 | නිවැරදිව ගලපන ලද ගිණුම්, යාවත්කාලීන කරන ලද ලේඛන | ඉදිරියේදී නිවැරදි කරන බව | වටිනාකම් ලබාගත් ආකාරය පිළිබඳ තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| ජ'නල් සටහන් 125 මඟින් ණයහිමියන්ට හර කරන ලද වටිනාකම | 8,398,993 | වටිනාකම සඳහා තහවුරු කිරීම | - | |
| | ------------- | | | |
| | 66,625,001 | | | |
| | ======== | | | |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනතේ විධිවිධාන දක්වමින් පළකර තිබූ 2235/54 හා 2021 ජූලි 08 දිනැති ගැසට් පත්‍රය<br>------------------- | | | |
| VI කොටසේ 83(1) වගන්තිය | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වාණිජ ගොඩනැගිලි සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත කර සංවර්ධන බලපත්‍රය ලබාගෙන තිබුණද, පුද්ගලයින් 51 දෙනෙකු විසින් අනුකූලතා සහතිකය ලබාගෙන නොතිබුණි. | නාගරික සංවර්ධන පනතේ ප්‍රතිපාදන අනුව ඉදිරි කටයුතු කරන බව දන්වා ඇත. | අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධනය වූ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 “අ“ කොටස | බල ප්‍රදේශයේ ආදාහනාගාරය හා අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර බලපත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව දන්වා ඇත. | බලපත්‍ර ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2015 අප්‍රේල් 14 වන දින ප්‍රාදේශීය සභාවේ සභාපති ගමන් කරමින් සිටියදී WPPF – 7366 දරන කැබ් රථය අනතුරට පත්ව පූර්ණ හානියට ලක්වී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් ඉල්ලා ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | මාස 06 ඉක්මවා ඇති නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.49,182 ක් වටිනා චෙක්පත් 06 ක් | මාස 6 ඉක්මවූ චෙක් ආදායමට ගැනීමට | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කටයුතු කරන බව දන්වා ඇත. | |
| (iii) | මුදල් රෙගුලාසි 571(1) හා (2) | කල් ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් ලැයිස්තු පිළියෙල කර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම වසරේ සිට සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ලැයිස්තු පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | 2019 දෙසැම්බර් සිට 2023 ජූලි දක්වා සභාවේ අනියම් හා ආදේශක සේවකයින් වෙත ගෙවීම් කර ඇති මාසික වැටුප්වලට අදාළව ගෙවිය යුතු සියයට 3 ක දායක මුදල් රු.432,132 ක් ගෙවීම් නොකිරීම හේතුවෙන් අධිභාර ගෙවීම් කිරීමට සිදුවී තිබුණි. (201,142) | සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ දැනුම් දීම අනුව ගෙවීමට කටයුතු කළ බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ අයභාරය රු.2,159,038 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ වියදම රු.42,743,575 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,351,091 | 9,300,151 | 8,086,473 | 4,064,081 | 9,854,319 | 10,793,144 | 10,115,549 | 2,850,403 |
| (ii) | කුලී | 34,469,004 | 14,194,996 | 15,524,102 | 11,517,190 | 37,687,276 | 23,010,550 | 17,635,820 | 12,846,296 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,222,500 | 2,442,490 | 2,310,120 | 1,286,153 | 3,198,750 | 1,853,443 | 1,115,219 | 1,153,783 |
| (iv) | වෙනත් ආදායම් | 11,126,145 | 9,486,450 | 8,147,476 | 7,834,234 | 11,683,872 | 5,634,270 | 4,866,140 | 6,495,260 |
| | | 58,168,740 | 35,424,087 | 34,068,171 | 24,701,658 | 62,424,217 | 41,291,407 | 33,732,728 | 23,345,742 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | | **වරිපනම් හා බදු** | | |
| | (i) | සමාලෝචිත වර්ෂය අවසානයේ දී අයකරගත යුතුව පැවති වරිපනම් බදු ආදායම රු.4,693,601 ක් විය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | සංගීත ප්‍රසංග සඳහා විනෝද බදු ආදායම ටිකට් පත් මත 10% ක් වුවද, සංගීත ප්‍රසංග 09 ක් සඳහා අයකර තිබූ ආදායම රු. 258,320 ක් වූයෙන් විනෝද බදු ආදායම ඉතා පහළ අගයක් ගෙන තිබුණි. | විනෝද බදු අයකිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ දැනට තිබෙන යාන්ත්‍රණයේ අඩුපාඩු පවතින බැවින් ඒවා නිවැරදි කිරීමට ඉදිරියේදි කටයුතු කරන බව දන්වා ඇත. | ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | | **කුලී** | | |
| | | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් කඩකාමර බදුදීම මඟින් අයකරගත යුතුව පවතින හිඟහිටි කඩ කුලී ශේෂය රු.5,646,292 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනිම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | | **වෙනත් ආදායම්** | | |
| | (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු පිළිවෙලින් රු.277,050 ක්, රු.526,090 ක් හා රු.198,610 ක් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟහිටි කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු වල හිඟ ආදායම් එකතු කරගැනීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.41,065,781 ක් හා මුද්දර ගාස්තු රු.25,451,400 ක් විය. | එම මුදල් ගෙන්වාගැනීමට බිල්පත් සහ ඇස්තමේන්තු සකස් කර ලිපි යවා ඇති බව සඳහන් කර ඇත. | අයකර කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථා**<br>ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු, පානීය ජලය විකිණීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ඉදිරියේදි මේ සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරනු ලබන බව | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **ක්‍රියාකාරී සැලැස්ම**<br>වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 14 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා අඩුපාඩු නිවැරදි කර ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව සකස් කරන ලද බව දන්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | **ඉටු නොකළ ව්‍යාපෘති**<br>වාර්ෂික අයවැය ලේඛනයේ දක්වා තිබුණු වටිනාකම රු.73,000,000 ක් වූ ව්‍යාපෘති 14 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛනයට ඇතුළත් කර තිබූ බව පමණක් පිළිගෙන ඇත. | අයවැය ලේඛනයට ඇතුළත් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | **අත්හැර දැමූ කතර්ව්‍යයන්**<br>ඉකුත් වර්ෂයන් තුළදී විද්‍යුත් පුස්තකාල 04 ක් ඉදිකිරීම් ආරම්භ කර ඒ සඳහා රු.5,344,186 ක් වැයකර තිබුණු නමුත්, 2024 මාර්තු 26 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට කටයුතු කරන බව | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**<br>බල ප්‍රදේශයේ ජනනය වන කසල කළමනාකරණය සඳහා ප්‍රාදේශීය සභාව වෙත අක්කර 25 ක බිම් කොටසක් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 34 රොටවැව ග්‍රාම නිලධාරි වසමෙන් 2019 වර්ෂයේදී වෙන්කර ඇති නමුත්, එහි කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සිදුකර නොතිබීම හේතුවෙන් ස්ථිර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කරගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ඉදි කිරීමට පෙර ඉඩම වටා විදුලි වැටක් ඉදිකර ගැනීමට අවශ්‍ය වී ඇති බැවින් ඉදිරියේදි මෙම විදුලි වැට ස්ථාපනය කිරීමෙන් පසු කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව දන්වා ඇත. | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ඉදිකර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් පරිදි ඉටුකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | රු.මිලියන 27.15 ක් වැය කර පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේ ඉදිකර ප්‍රාදේශීය සභාව වෙත භාරදුන් කඩකාමර 92 කින් සමන්විත හිඟුරක්ගොඩ පොදු වෙළඳපොල කුලියටදීම සඳහා ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව සභාපතිවරයා හා සභාව විසින් ගනු ලැබූ තීරණ හේතුවෙන් කුලියට ලබාදීම ප්‍රමාදවීම මත වර්ෂ 04 කට ආසන්න කාලයක් නිෂ්ක්‍රීයව පවතින අතර, ඒ අනුව තක්සේරු කුලිය මත ඉකුත් වර්ෂයේ සිට සභාවට අහිමි වූ ආදායම රු.25,263,200 ක් විය. | හිගුරක්ගොඩ නව පොදු වෙළඳපළ කඩ කාමර 92 න් පැරණි කඩ හිමියන් 75 දෙනා අතරේ කඩ කාමර බෙදා දිම යටතේ පළමු අදියර වූ පළාත් පාලන කොමසාරිස්තුමා විසින් තෝරා එවන ලද කඩ හිමියන් 28 දෙනාගෙන් 27 දෙනෙකු වෙත ගිවිසුම්ගතව කඩ කාමර ලබාදී ඇති අතර, දෙවන අදියර යටතේ සභාව විසින් තෝරාගන්නා ලද කඩ හිමියන් 20 දෙනා අතුරින් කඩ කාමර 7ක් බෙදා දිම පළාත් පාලන කොමසාරිස්තුමන් විසින් තාවකාලිකව අත්හිටුවා ඇති බව දන්වා ඇත.<br>තෙවන අදියර යටතේ ටෙන්ඩර් කිරිමට නියමිත ඉහළ මහළ කඩ කාමර 17 න් කඩ කාමර 8 ක් මේ වන විට ටෙන්ඩර් කර ගිවිසුම්ගතව ලබා දී ඇති අතර, ඉතිරි කඩ කාමර 9 සඳහා දෙවන වරට ටෙන්ඩර් කැදවා ඇති බවත්, කඩ හිමියන් 75 දෙනාගෙන් ඉහළ මහළ සදහා ඉතිරි වන කඩ හිමියන් 27 දෙනා අතරේ ඉහළ මහල ඉතිරි කඩ කාමර 27 බෙදා දිම ඉහතින් සදහන් කළ පළමු හා දෙවන අදියර අවසන් වන තුරු ක්‍රියාත්මක කිරිමට නොහැකි වී ඇති බව දන්වා ඇත. | අප්‍රමාදව වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ වාහන හා යන්ත්‍ර කුලියට දීම මඟින් අයවිය යුතු හිඟ ශේෂය රු.6,357,978 ක් වූ අතර, ඉන් පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යන්ත්‍ර කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් අයවිය යුතු රු.3,122,898 ක් අදාළ ව්‍යාපෘතිය අවසන් කර වර්ෂ 02 ක් ගත වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි. | මෙම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා මේ වන විට අදාළ පුද්ගලයන් හා ආයතන වෙත ලිපි මඟින් හා දුරකථනයෙන් දැණුම්දීම් සිදු කර ඇති බව | හිඟ ශේෂයන් නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය

වටිනාකම රු.36,079,412 ක් වූ සභාව සතු වත්කම් 13 ක් ද සමාලෝචිත වර්ෂයේදී ද නිෂ්ක්‍රීයව පැවතුණි.

| වත්කම | වටිනාකම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | රු. | | |
| මින්නේරිය උප කාර්යාල භූමියේ යුගල නිවාස අංක 01 | 2,800,000 | මින්නේරිය උප කාර්යාල භූමියේ යුගල නිවාස අංක 04 හා මින්නේරිය උප කාර්යාල භූමියේ නිවාස අංක 02 නමින් සඳහන් නිල නිවාස දෙක සඳහා මෙතෙක් කිසිදු නිළධාරියෙක් හෝ සේවකයෙක් ඉල්ලීම් කර නොමැති බව දන්වා ඇත. | වත්කම් උපයෝජනය කිරීමය කටයුතු කළ යුතුය. |
| මින්නේරිය උප කාර්යාල භූමියේ නිවාස අංක 02 | 3,200,000 | | |
| මින්නේරිය පුස්තකාලය අසල නිල නිවස | 2,800,000 | | |
| ට්‍රැක්ටරය - 37 ශ්‍රී 5031 | 200,000 | වෙන්දේසි කිරිමට නිර්දේශ ලැබී ඇති බව දන්වා ඇත. | වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |
| ට්‍රැක්ටරය RA-7618 | 850,000 | මීටරය අක්‍රිය තත්වයේ පැවතීම හා අලුත්වැඩියා තත්වයක් හේතුවෙන් තාවකාලිකව නවතා ඇත. | අලුත්වැඩියා කළ යුතුය. |
| මාර්ග තලනය | 3,500,000 | මෙ සම්බන්ධයෙන් යාන්ත්‍රික ඉංජිනේරු අධීක්ෂණය සිදු වී අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | අලුත්වැඩියා කටයුතු ප්‍රමාද නොවිය යුතුය. |
| මෝටර් ග්‍රේඩරය | 14,680,000 | යාන්ත්‍රික ඉංජිනේරු උපදෙස් මත මෙහි හඳුනාගන්නා ලද දෝෂ තත්වය ඇති ටැන්ඩම් කොටස කොළඹ ඩීසල් මෝටර් ඇන්ඩ් ඉංජිනියරිං ආයතනය වෙත රැගෙන ගිය අතර, එහිදී එම කොටස් වෙන් කිරීමෙන් පසු අප වෙත ඉදිරිපත් කරන ලද මිළ ඇස්තමේන්තුව ඉතා අධික බැවින් එම මිළ ගණන් යටතේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට යාන්ත්‍රික ඉංජිනේරුවරයා කිසිසේත් එකඟ නොවන බවත් එම ගලවන ලද කොටස් නැවත ගෙන්වා ගන්නා ලෙසත් නිර්දේශ කිරීම මත ඉදිරි පියවර ගනිමින් සිටින බව දන්වා ඇත. | යෝග්‍ය අලුත්වැඩියාවන් සිදුකර භාවිතයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| සිමෙන්ති ගල් කැපීමේ යන්ත්‍රය | 130,862 | මෙ වන විට මෙම උපකරණයෙන් කාර්යක් ඉටු කර නොගන්නා අතර කුලියට ලබා දීම සඳහා පාරිභොගික ඉල්ලීම්ද ලැබී නොමැති බව දන්වා ඇත. | දීර්ඝ කාලීනව නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධව සුදුසු තීරණගත යුතුය. |
| රෝනියෝ ඩුප්ලෝ යන්ත්‍රය | 209,500 | ඉදිරියේදි මිළ ගණන් කැදවා අලුත්වැඩියා කිරිමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | කඩිනමින් අලුත්වැඩියා කටයුතු නිම කළ යුතුය. |
| කැබ් රථය - PF-7366 | 6,390,000 | මෙම රථය දැඩි ලෙස අලාභ හානියට පත්ව තිබීම හේතුවෙන් අළුත්වැඩියා කිරීමට ප්‍රමාණවත් මුදලක් සභාව සතුව නොමැති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි අනුව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකළ යුතුය. |
| ලොරි කැබ් රථය - LF – 4837 | 1,319,050 | අපහරණය කිරීමට නිර්දේශ ලැබී ඇති බව දන්වා ඇත. | අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| ගිනි නිවීමේ රථය ZA-5435 | - | මෙම රථය අප සභා භූමියේ පවතින අතර පොළොන්නරුව මහා නගර සභාව විසින් මෙහි අයිතිය ලබා දෙන මෙන් ඉල්ලීම් කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා අප විසින් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. | උපයෝජනය කළ නොහැකි වත්කම් අවශ්‍ය ස්ථානයකට ලබාදිය යුතුය. |
| ගිනි නිවීමේ රථය 41 ශ්‍රී 8078 | - | දැනට ගිනි නිවීමේ ඒකකයක් නොමැති බැවින් එකි වාහන ගාල් කර තැබීමේදි ඇතිවන ආපදා තත්වය සලකා මෙම වාහන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබා දීමට අවශ්‍ය කටයුත් සිදු කරමින් පවතින බව දන්වා ඇත. | උපයෝජනය කළ නොහැකි වත්කම් අවශ්‍ය ස්ථානයකට ලබාදිය යුතුය. |
| | -------------- | | |
| එකතුව | 36,079,412 | | |
| | ======== | | |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | හිගුරක්ගොඩ ප්‍රාදේශීය සභාව සතුව පවතින වාහන හා යන්ත්‍රෝපකරණ 38 ක් ගාල්කිරීම සඳහා ආරක්ෂිත ආවරණයක් සහිත ස්ථානයක් නොපැවතුණි. | මේ වන විට සභාවේ ආදායම් තත්වය අයහපත් තත්වයක පවතින අතර ඉදිරි අයවැය මඟින් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඉතා කඩිනමින් වාහන ආවරණ අංගනයක් ඉදිකිරිමට කටයුතු කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම්වල ආරක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සභාව සතුව ධාවනයෙන් තොරව පවතින හා අලුත්වැඩියා මට්ටමේ පවතින වාහන හා යන්ත්‍ර 08 ක් සම්බන්ධව අලුත්වැඩියා කටයුතු මාස 02 ත් වර්ෂ 03 ත් අතර කාලයක සිට ප්‍රමාදව පැවතුණි. | | | |
| | SD – 5183 | Sun Fang | ධාවනය කිරීමට ටයර් ලබා ගැනීමට අවශ්‍ය බව දන්වා ඇත. | වත්කම් භාවිතයට ගත යුතුය. |
| | 37 ශ්‍රී 5031 | Tractor FORD | වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇති බව දන්වා ඇත. | නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| | JB 8453 | Tailor | අබලන් තත්වයේ පවතින බව දන්වා ඇත. | වත්කම් ප්‍රයෝජනයට නොගන්නේ නම් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | NCRA 8892 | Tractor | වයරිං වැඩ වල අළුත්වැඩියාවක් පවතින බැවින් තාවකාලිකව නවතා ඇත. | අලුත්වැඩියාවන් ප්‍රමාද නොවිය යුතුය. |
| | 44 ශ්‍රී 4563 | MASSY FERGUSON TRACTOR | අළුත්වැඩියාවක් සිදුකරමින් පවතින බව දන්වා ඇත. | අලුත්වැඩියාවන් ප්‍රමාද නොකළ යුතුය. |
| | 25 ශ්‍රී 9780 | MASSY FERGUSON TRACTOR | පිළිතුරු ලබා දී නැත. | අලුත්වැඩියාවන් ප්‍රමාද නොකළ යුතුය. |
| | 107 – 8341 | MASSY FERGUSON TRACTOR | යාන්ත්‍රික ඉංජිනේරු උපදෙස් මත අළුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | අලුත්වැඩියාවන් ප්‍රමාද නොකළ යුතුය. |
| (ඇ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ ඇති වාහන හා යන්ත්‍රෝපකරණ 06 ක් සභාව නමින් ලියාපදිංචි කරගෙන නොතිබුණි. | | පවරාගැනීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. | පවරා නොගත් වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 112 ක් වූ අතර, ස්ථිර කාර්ය මණ්ඩලයේ 78 ක් හා අනියම් හා ආදේශක සේවකයින් 26 ක් සේවයේ යෙදී සිටි අතර අනුමත කාර්ය මණ්ඩලයේ සේවක පුරප්පාඩු 23 ක් පැවතුණි. | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින්සිදු කළ යුතු බව දන්වා ඇත. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු අනුමත නොවූ කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 03 ක සේවකයින් 06 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දි ඇති පරිදි මෙම තනතුරු අනුමත කර ගැනිමට ඉදිරි කටයුතු ආරම්භ කර ඇති බව දන්වා ඇත. | නිවැරදි කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගිය, වැඩ තහනමට ලක්වූ, සේවයෙන් ඉවත්කළ හා සේවය හැර ගිය, ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 59 දෙනෙකුගෙන් දීර්ඝ කාලයක සිට අයනොවී පවතින ණය ශේෂය රු.794,509 ක් නිරවුල් කරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | මෙම සේවක ණය 1988 වර්ෂයේ ලේඛනවල සිට දිගින් දිගටම පැවතගෙන එන ණය ශේෂ වන අතර මේවා නිරවුල් කිරීම සඳහා ලිපිගොනු සොයාගැනීමටද නොහැකි වී ඇත. | මෙම හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |